**උතුරු මාර්ග පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය (පුත්තලම - මරිච්චිකඩේ - මන්නාරම මාර්ගය පුනරුත්ථාපනය කිරීම) - 2014**

---------------------------------------------------------------------------------------------------

උතුරු මාර්ග පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතියේ (පුත්තලම - මරිච්චිකඩේ - මන්නාරම මාර්ගය පුනරුත්ථාපනය කිරීම) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා චීන අපනයන - ආනයන බැංකුව අතර 2011 අප්‍රේල් 29 දින එළඹි අංක බීඑල්ඒ 201112 දරන ණය ගිවිසුම ප්‍රකාරව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

---------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය, වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ජාතික මට්ටමින් ව්‍යාපෘතියේ කටයුතු කළමනාකරණය හා සම්බන්ධීකරණය කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය වගකිව යුතු වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ පුත්තලම - මරිච්චිකඩේ - මන්නාරම මාර්ගයේ කිලෝමීටර් 113 ක් පුනරුත්ථාපනය කිරීමයි. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එජඩො මිලියන 86.11 ක් වන අතර ඉන් එජඩො මිලියන 73.21 ක් හෝ සියයට 85 ක් මූල්‍යායනය කිරීමට චීන අපනයන - ආනයන බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ මූලික වැඩ 2012 අගෝස්තු 24 දින ආරම්භ කරන ලද අතර 2015 පෙබරවාරි 23 දින වන විට නිමකිරීමට සැලසුම් කර තිබුණි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා

කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

---------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

----------------

**2.1 මතය**

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

---------------------------------------

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

-------------------------

උපදේශක සේවා හා සිවිල් වැඩ කොන්ත්‍රාත් ගිවිසුමට අනුව, ව්‍යාපෘතිය විසින් සපයන ලද අරමුදල්වලින් කොන්ත්‍රාත්කරු හා ව්‍යාපෘතිය විසින් මිලදී ගන්නා ලද වාහන, උපකරණ, ලී බඩු ආදී වත්කම් ව්‍යාපෘතියේ දේපල ලෙස සලකනු ලැබේ. කෙසේ වුවද කොන්ත්‍රාත්කරු හා උපදේශකවරු මඟින් ප්‍රසම්පාදනය කරන ලද වාහන හා උපකරණ ආදී එවැනි වත්කම්වල

වට්නාකම වෙනම හඳුනාගෙන ඒ අනුව ගිණුම්ගත කරනු වෙනුවට නිමකරන ලද සිවිල් වැඩ යටතේ දක්වා තිබුණි.

### 2.2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන චක්‍රලේඛයේ 8.3.9 වගන්තියේ උපදෙස්වලට පටහැනිව රු.667,299 ක මුදලක් පොදු කාර්ය ගාස්තු ලෙස මාර්ග සංවර්ධන අධිකාරියට ප්‍රේෂණය කර තිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 වගන්තියට පටහැනිව, තාවකාලික මුදල් හා අසම්භාව්‍යයන් ඇතුළත් මුළු කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 30 ක් වන එකතුව රු.මිලියන 988.7 ක් වූ අත්තිකාරම් ගෙවීම් කර තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

අරමුදල් මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය තුළ හා 2014 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | උපයෝජනය කළ අරමුදල් | | |
|---|---|---|---|---|---|
| | | | 2014 වර්ෂය තුළ | 2014 දෙසැම්බර් 31 දිනට | |
| | එජඩො. මිලියන | රු. මිලියන | රු. මිලියන | එජඩො. මිලියන | රු. මිලියන |
| චීන එක්සිම් බැංකුව | 73.21 | 9,887.50 | 3,278.8 | 41.55 | 5,427.84 |
| ශ්‍රී ලං ර | 12.90 | 1,808.12 | 64.6 | 12.49 | 1,675.33 |
| | 86.11 | 11,695.62 | 3,343.4 | 54.04 | 7,103.17 |

**3.2 භෞතික ප්‍රගතිය**

**------------------**

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ) බාහිර පාර්ශවයන් විසින් මූලික අයිතිවාසිකම් නඩුවක් ගොනුකර තිබීම හේතුවෙන් මුල් වැඩ විෂය පථය යටතේ සිදු කළ යුතු පුත්තලම - මරිච්චිකඩේ - මන්නාරම මාර්ගයේ කිලෝමීටර් 113 ක පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම් වැඩවලින්, විල්පත්තු අභයභූමිය හරහා වැටී තිබෙන එළුවන්කුලම සිට මරිච්චිකඩේ දක්වා කිලෝමීටර් 36 ක මාර්ග කොටසේ පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම් වැඩ පසුව අත් හැර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මුල් වැඩ විෂය පථයෙන් සියයට 31.8 ක් අත් හැර තිබුණද, කොන්ත්‍රාත්තුවේ අරමුණු කළ වැඩ නිමකිරීම් දිනය, වැඩ අඩුකිරීම මත සංශෝධනය කිරීමට සහ වැඩිපුර ගෙවන ලද වැඩපූර්ව අත්තිකාරම් මුල් පිරිවැය ඇස්තමේන්තුව මත ගණනය කර අයකර ගැනීමට ව්‍යාපෘතිය විසින් පියවර ගෙන නොතිබුණි.

(ii) සංශෝධිත වැඩ විෂය පථය පදනම්ව අධීක්ෂණ උපදේශක සේවය සඳහා වැඩ ප්‍රමාණය නැවත සලකා බලා නොතිබූ අතර ඒ අනුව උපදේශක සේවා සඳහා කාලය හා ගාස්තු සංශෝධනය කර නොතිබුණි.

(iii) මූලික අයිතිවාසිකම් නඩුව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගයට අනුව, 2015 පෙබරවාරි 13 දිනැති නේවාසික ඉංජිනේරුගේ ලිපියෙන්, විල්පත්තු අභයභූමිය තුළ මාර්ගයේ සාමාන්‍ය නඩත්තු වැඩ සිදු කිරීමට හා වාහන ගමනාගමනයට සුදුසුසේ තබා ගැනීම සඳහා බෝක්කු 33/7 හා 34/1 අලුත්වැඩියා කිරීමට උපදෙස් දී තිබුණි. කෙසේ වුවද බෝක්කු අලුත්වැඩියා කිරීම කොන්ත්‍රාත්කරු විසින් සිදු කර නොතිබුණි.

(ආ) 2014 අගෝස්තු 12 දිනැති අංක C3/39C/00271 දරන නේවාසික ඉංජිනේරුගේ ලිපියට අනුව පදික මාර්ගයේ ඇස්පල්ට් කොන්ක්‍රීට් අතුරා පුනරුත්ථාපනය කරන ලද කොටසේ ස්ථාන 25 ක පිපිරීම් නිරීක්ෂණය විය. කෙසේ වුවද කොන්ත්‍රාත්කරු විසින් පිපිරීම් සඳහා පිළියම් කළ බවට තහවුරු කර ගැනීම සඳහා සාක්ෂි නොතිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

**------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අනුමැතිය නොමැතිව ඉදිකරන ලද ගොඩනැගිල්ලක් කඩා ඉවත් කිරීම වෙනුවට සිලාවතුර මංසන්ධියේ අඩිපාරෙහි පළල අඩු කිරීම සඳහා ව්‍යාපෘතිය පියවර ගෙන තිබූ බව විගණකවරුන් කරන ලද වැඩ බිම් පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ආ) ආරාවුල් විනිශ්වය ගිවිසුම අනුව, තීරක මණ්ඩල සාමාජිකයන්ගේ වියදම් බෙදා ගැනීමට සේවාදායක හා කොන්ත්‍රාත්කරු එක්ව හා වෙන් වෙන්ව වගකිව යුතු වේ. කෙසේ වුවද තීරක මණ්ඩල සාමාජිකයන් සඳහා ගාස්තු ගෙවීම සම්බන්ධයෙන් දරන ලද රු.මිලියන 3.01 ක මුදලක් ව්‍යාපෘතියෙන් අයකර තිබුණි. තවද ආරාවුල් විනිශ්වය

මණ්ඩලය පසුව අවසන් කර තිබූ අතර, කොන්ත්‍රාත්කරු සමඟ ඇති කරගත් ගිවිසුමක් මඟින් ආරාවුල් විසඳීම සඳහා ව්‍යාපෘතිය පියවර ගෙන තිබුණි.

## 3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

-----------------------------------

මන්නාරමේ වන්කලායි හි සෙන්ට් ඈන්ස් මධ්‍ය මහා විද්‍යාලය සඳහා ප්‍රවේශ මාර්ගයේ ඉදිකිරීම් වැඩ ප්‍රධාන වැඩවල විචලනයක් ලෙස රු.මිලියන 7.44 ක පිරිවැයකට ව්‍යාපෘතිය විසින් නිමකර තිබුණි. තවද විචලනයක් ලෙස රු.මිලියන 681.60 ක පිරිවැයකට නවට්කුලි - කරෙයිතිවු - මන්නාරම මාර්ගයේ කිලෝමීටර් 3.9 ක මාර්ග කොටස පුනරුත්ථාපනය කිරීමද ව්‍යාපෘතිය විසින් සිදු කර තිබුණි. තාක්ෂණික ඇගයීම් කමිටුවේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව ව්‍යාපෘතිය විසින් ඒ සඳහා පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කර අනුමත කර තිබූ බව නිරීක්ෂණය විය.